# සංක්ෂිප්තය

පාසල් තුළ පවතින විනය ගැටලු සඳහා විනය කළමනාකරණයේ ස්වභාවය බලපා ඇති ආකාරය සොයා බැලීමේ වැදගත්කම මත මෙම පර්යේෂණ අවශ්‍යතාව ඉස්මතු විය. එහිදී පාසල් කළමනාකරණය භාවිත කරන විනය කළමනාකරණ ක්‍රම ශිල්ප අනාවරණය කර ගැනීමට 2011 වර්ෂය පාදක වර්ෂය වශයෙන් යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා සබරගමු පළාතට අයත් බලංගොඩ අධ්‍යාපන කලාපයේ බලංගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ විදුහල්පති, ගුරු හා සිසු පිරිසක් යොදා ගැනුණි.

ශිෂ්‍ය විනය ගොඩ නගා ගැනීමට පාසල් කලමනාකරුවන් නොයෙකුත් ක්‍රියාමාර්ග අනුගමනය කළද වර්තමානයේ පාසල්වල විනය ගැටලු සංකීර්ණ ස්වභාවයක් ගෙන ඇතිබව පෙනී යයි. මේ හේතුවෙන් මනා විනයක් ගොඩ නැගීමට ගනු ලබන විනය පාලන ක්‍රියාමාර්ග පාසල් විනය කළමනාකරණ පාර්ශවයන්ගෙන් විමසා බැලීම තුළින් විනය කළමනාකරණය පවතින තත්වය වටහා ගැනීමට උත්සාහ දරණු ලැබිණි.

මේ සඳහා පූර්ව පර්යේෂණ සොයා බැලීමට සාහිත්‍ය විමර්ශනය මගින් හැකි වූ අතර විවිධ පොත පත මෙන්ම දේශීය සහ විදේශීය පර්යේෂණ එහිදී යොදා ගැණිනි. ඒ අනුව විනය ගැටලු, පාසල් විනය ගැටලු කළමනාකරණයට යොදා ගන්නා විනය කළමනාකරණ ක්‍රම ශිල්ප, විනය කළමනාකරණයේදී විනය කළමනාකරුවන් මුහුණ දෙන ගැටලු සහ පාසල් විනය ගැටලු අවම කිරීමට විනය කළමනාකරුවන් ඉදිරිපත් කරන යෝජනා යන සුවිශේෂී අරමුණු ඔස්සේ පර්යේෂණය ගොඩ නැංවීය.

සුවිශේෂී අරමුණු ආවරණය කිරීමට පාසල් තුනකින් විදුහල්පතිවරුන් තිදෙනෙක්, ගුරුවරුන් හැට දෙනෙක්, සහ ශිෂ්‍ය නායකයින් නව දෙනෙකු නියැදිය ලෙස යොදා ගැනීමට සැලසිණි. උපරිම විශ්වසනීයතාවයක් සහ පර්යේෂණ දත්තවල නිවැරදිභාවය ආරක්ෂා කර ගැනීමට පාසල් තුනක් වැනි සීමිත නියැදියක් භාවිත කරන ලදී. පර්යේෂණ දත්ත ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සහ නිරීක්ෂණ යන ක්‍රම අනුගමනය කරන ලදී.

මෙම පර්යේෂණය මඟින් පාසල් තුළ පවතින විවිධ විනය ගැටලු රාශියක් අනාවරණය කර ගැනීමට හැකිවූ අතර පාසල් නිළ ඇඳුම ක්‍රමානුකූල නොවීම, ශිෂ්‍යන් අතර ඇතිවන ගැටුම්, සහ පාසලේ දේපළ ආරක්ෂා නොකිරීම වැඩි වශයෙන්ම පවතින විනය ගැටලු වශයෙන් තහවුරු විය. අඩුවෙන්ම පාසල්වල පවතින විනය ගැටලු ලෙස අසභ්‍ය රූප වීඩියෝ භාවිත කිරීම සහ මත්ද්‍රව්‍ය අලෙවිය සඳහන් විය. විනය කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන අනාවරණයක් වූයේ විනය කළමනාකරණය සඳහා ශාරීරික දඬුවමද අවශ්‍ය බව බහුතරයක් ගුරුවරුන්ගේ අදහස වශයෙන් අනාවරණය වීමයි. පාසල් විනය කමිටුවේ ක්‍රියාකාරීත්වය දුර්වල වීම විනය ගැටලුවකදී විනය කළමනාකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බව පර්යේෂණ දත්ත තහවුරු කරයි. පාසල් විනය ගැටලු අවම කිරීමට සාරධර්ම පාදක කොටගත් අධ්‍යාපනය සහ මනා ගුරු සිසු සම්බන්ධතාවයේ වැදගත්කම අවධාරණය විය. මේ අනුව ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයන්ද ඉදිරිපත් කර ඇත.

# Abstract

The research has mainly focused to find out the impact of the nature of discipline management on the breach of discipline in the school. Year 2011 was considered as the base year to review the methods of discipline management that are followed by school management. Principals, Teachers and Students of the Balangoda Educational Division of the Balangoda Education zone in the Sabaragamuwa Province were involved in the research.

At present breach of discipline has become very complex in nature in the school though several methods have been followed by schools' discipline committees to develop students' discipline. Therefore the research has attempted to realize the condition of the discipline management and the methods of discipline control that are taken to promote discipline of children by schools discipline committees.

The literary survey contributed to find out pre-research findings. Here local research and research of other countries were referred. According to that the research has been developed to find out discipline problems in schools, discipline management methods, issues that are faced by discipline committee when managing discipline and suggestions of discipline committees to minimize the discipline issues. The sample consisted of three principals, sixty teachers and nine prefects. This sample was used to achieve the specific objectives of the research. The data have been collected only from three schools to ensure a higher degree of accuracy and reliability in the research. The data collection methods of the research were questionnaires, interviews and observations.

The research could review a number of discipline issues that are in schools. The most popular issues were indefinite school uniforms, conflicts among students, and careless attention towards school property.

The frequency of watching impolite video clips and the drug peddling are less. According to the findings majority of the people claimed that there should be physical punishments to manage the discipline in schools. Inactive discipline committees in the school is a main issue that are faced by the discipline managers. Research discloses a healthy relationship between teachers and students and the moral education will contribute to reduce the discipline issues at schools. The research has denoted the optional methods that can be taken against the breach of discipline at schools.